කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි.
Issued by Forecasting Division, National Meteorological Centre.

2020 මැයි මස 19 දින සඳහා කාලගුණ අනාවැකිය
**2020 මැයි මස 18 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**දකුණු බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති ප්‍රචණ්ඩ සුළි කුණාටුව ("අම්ෆන්") මේ වනවිට ඉතා ප්‍රචණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වී ඇත. එම පද්ධතිය, 18 වන දින පෙ.ව. 05.30 වන විට ත්‍රිකුණාමලය සිට කි.මී 765 පමණ ඊසාන දෙසින් උතුරු අක්ෂාංශ 13.2 ත් නැගෙනහිර දේශාංශ 86.3 ත් ආසන්නව මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව ස්ථානගතව පවතී. මෙම පද්ධතිය ඉදිරි පැය 12 තුලදී අතිප්‍රචණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වේ යයි අනුමාන කෙරේ. මෙය උතුරට බරව ඊසාන දෙසට හැරී 20 වන දින අපරභාගය වන විට බටහිර බෙංගාල වෙරළ වෙත ගමන් කරනු ඇතැයි බලාපොරොත්තුවේ.**

**එහි බලපෑම හේතුවෙන් දිවයිනේ විශේෂයෙන්ම නිරිතදිග කොටසේ පවතින වැසි තත්ත්වය තවදුරටත් බලාපොරොත්තුවේ. ඇතැම් ස්ථාන වලට මි.මී.150 ට වැඩි ඉතා තද වර්ෂාපතනයන් ද ඇති විය හැක. දිවයින හරහා සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (60-70) දක්වා වැඩි විය හැක. දිවයින පුරා අහස වලාකුලින් බරව පවතිනු ඇත.**

**දකුණ, බස්නාහිර, සබරගමුව, මධ්‍යම සහ වයඹ පළාත් වල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වන අතර ඇතැම් ස්ථාන වලට 150 mm ඉක්මවූ ඉතා තද වැසිද ඇති විය හැක.**

**උතුරු සහ උතුරු-මැද පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වන අතර සෙසු ප්‍රදේශවල සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.**

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR 19 MAY 2020

**Issued at 12.00 noon on 18 May 2020**

**The Very Severe Cyclonic storm ”AMPHAN” ( pronounced as UM-PUN) further intensified into an Extremely Severe Cyclonic Storm and lay centred over Central part of South Bay of Bengal and neighborhood, at 05.30 a.m. of 18th May near latitude 13.2°N and longitude 86.3°E, about 765 km North-east of Trincomalee. It is very likely intensify into a Super Cyclonic storm during next 12 hours and likely to move north-northeastwards towards west Bengal coast during the afternoon of 20th May.**

**Due to the influence of the system the prevailing showery condition over the island particularly in the south-western part is likely to continue further. Very heavy showers above 150 mm are likely at some places. Wind speed can increase up to (60-70) kmph at times over the island. Cloudy skies can be expected over the island.**

**Showers or thundershowers will occur in Southern, Western, Sabaragamuwa, Central and North-western provinces with isolated very heavy showers exceeding 150 mm.**

**Showers or thundershowers will occur at times in North and North-central provinces and Showers or thundershowers will occur in the afternoon or night elsewhere.**

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය
## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකි
2020 මැයි මස 18 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

දකුණු බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති ප්‍රචණ්ඩ සුළි කුණාටුව ("අම්ෆන්") මේ වනවිට ඉතා ප්‍රචණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වී ඇත. එම පද්ධතිය, 18 වන දින පෙ.ව. 05.30 වන විට ත්‍රිකුණාමලය සිට කි.මී 765 පමණ ඊසාන දෙසින් උතුරු අක්ෂාංශ 13.2 ත් නැගෙනහිර දේශාංශ 86.3 ත් ආසන්නව මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව ස්ථානගතව පවතී. මෙම පද්ධතිය ඉදිරි පැය 12 තුලදී අතිප්‍රචණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වේ යයි අනුමාන කෙරේ. මෙය උතුරට බරව ඊසාන දෙසට හැරී 20 වන දින අපරභාගය වන විට බටහිර බෙංගාල වෙරළ වෙත ගමන් කරනු ඇතැයි බලාපොරොත්තුවේ.

ධීවර හා නාවුක කටයුතු වල යෙදෙන්නන් මේ සම්බන්දයෙන් නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානයෙන් කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

**වැසි තත්ත්වය:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.
පුත්තලම සිට ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල ඇතැම් ස්ථානවල තද වැසිද ඇතිවිය හැක.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමයි. සුළගේ වේගය පැ.කි.මී. (50-55) පමණ වේ. පුත්තලම සිට ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (70-80) දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශ තරමක් රළු විය හැකි අතර පුත්තලම සිට ගාල්ල, හම්බන්තොට සහ පොතුවිල් හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු වේ.
ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල (පැ.කි.මී. 70-80 දක්වා) තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS

**Issued at 12.00 noon on 18 May 2020**

**The Very Severe Cyclonic storm "AMPHAN" ( pronounced as UM-PUN) further intensified into an Extremely Severe Cyclonic Storm and lay centred over Central part of South Bay of Bengal and neighborhood, at 05.30 a.m. of 18th May near latitude 13.2°N and longitude 86.3°E, about 765 km North-east of Trincomalee. It is very likely intensify into a Super Cyclonic storm during next 12 hours and likely to move north-northeastwards towards west Bengal coast during afternoon of 20th May.**

**Fishing and naval community are requested to be attentive regarding future forecasts issued in this regard.**

### Condition of Rain:

Showers or thundershowers will occur at times in the sea areas around the island.
Heavy showers can be expected at some places in the sea areas extending from Puttalam to Pottuvil via Colombo, Galle and Hambantota.

### Winds:

Winds will be South-westerly in the sea area around the island. Wind speed will be **(50-55) kmph**. Wind speed can be increased up to **(70-80) kmph** at times in the sea area extending from Puttalam to Pottuvil via Colombo, Galle and Hambantota.

### State of Sea:

The sea areas around the island can be fairly rough and the sea area extending from Puttalam to Trincomalee via Colombo, Galle, Hambantota and Potuvil will be very rough at times.

**Temporarily strong gusty winds (up to 70-80 kmph) and very rough seas can be expected during thundershowers**.

**Naval and fishing communities are requested to be vigilant in this regards.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි